www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA

## දෙවන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

10 ශ්‍රේණිය | නර්තනය | කාලය පැය - 02

## 08 - නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු විමසමු

- ප්‍රශ්න අංක 01 සිට 18 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) "ඉබන් බතුතා" නම් විදේශීය වාර්තාකරු ලංකාවට පැමිණ ඇත්තේ කුමන රාජ්‍ය යුගයකදී ද?

1) යාපහුව 2) මහනුවර 3) ගම්පොළ 4) කෝට්ටේ

02) දුටුගැමුණු රජතුමා නළඟනන් පිරිවරාගෙන රුවන්වැලිසෑය බඳින උත්සවයට ගිය බව සඳහන් වන්නේ,

1) චූලවංසයේ ය. 2) මහාවංසයේ ය.
3) ථූපවංසයේ ය. 4) දීපවංසයේ ය.

03) රජු ඉදිරිපිට දෙවි මිනිස් නැටුම් කරවූ බවට තොරතුරු හමුවන්නේ කුමන යුගයකදී ද?

1) කෝට්ටේ 2) දඹදෙණි
3) අනුරාධපුර 4) පොළොන්නරු

04) මහනුවර ඇසළ පෙරහැර පිළිබඳ තොරතුරු වාර්තා කළ දේශාටන වාර්තාකරුවෙකු වන්නේ,

1) ෆාහියන් හිමි 2) රොබට් නොක්ස්
3) ජෝන් ඩේවි 4) අලගනායිදු

05) මහාවංසයේ සඳහන් වන අන්දමට මහා පරාක්‍රමබාහු රජුගේ නර්තනයට හා ගායනයට දක්ෂ බිසව කවුද?

1) ලීලාවති 2) රූපාවතී
3) කල්‍යාණවතී 4) සෝමාවතී

06) පොළොන්නරු යුගයේ නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබූ බවට ඇති කදිම නිදසුනකි,

1) දැදිගම කොට වෙහෙර 2) අංක 2 දරණ ශිව දේවාලය
3) නටරාජා රූපය 4) සරස්වතී මණ්ඩපය

07) පන්සියක් පමණක් හින්දු බාලිකාවෝ නර්තනයෙහි යෙදුන බව සඳහන් කර ඇත්තේ කුමන දේශාටකයෙකු විසින්ද?

1) ස්පිල්බර්ජන් 2) රොබට් නොක්ස්
3) ඉබන් බතුතා 4) රවීන්ද්‍රනාත් තාගෝර්

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

08) ශ්‍රී ලංකාවේ නර්තන කලා ඉතිහාසය හා සම්බන්ධ ඉතා වැදගත් සාධක දෙකක් ලෙස සැලකිය හැක්කේ,

1) ඉතිහාස ග්‍රන්ථ හා ජනකවි
2) වංශකතා සහ දේශ සංචාරකයන්ගේ වාර්තා
3) ලෙන් ලිපි හා බෞද්ධ කතා
4) සන්දේශ කාව්‍ය හා බෙර වර්ග

09) ගම්පොළ යුගයේ ලංකාවට පැමිණි දේශාටන වර්තාකරුවෙකි,

1) රොබට් නොක්ස්
2) ස්පිල්බර්ජන්
3) ෆාහියන් හිමි
4) ඉබන් බතුතා

10) මහා පරාක්‍රමබාහු රජු කාව්‍ය ශාස්ත්‍ර, ගී, නැටුම් ඉගෙන ගත් බව සඳහන් වන්නේ,

1) චූලවංශයේ ය.
2) ථූපවංශයේ ය.
3) දාඨා වංශයේ ය.
4) කඳවුරු සිරිතේ ය.

11) මහා වංශයේ සඳහන් පරිදි, මහා බෝධියට නානුමුර මංගල්‍යයක් පවත්වන අවස්ථාවේ තූර්ය වාදන පවත්වන ලද රජතුමා වූයේ කවුද?

1) දුටුගැමුණු රජු
2) භාතිකාභය රජු
3) පරාක්‍රමබාහු රජු
4) වසභ රජු

12) භාතිකාභය රජ සමයේ මහා ථූපය පිරියම් කොට නැටුම්, ගැයුම්, වැයුම්වලින් පූජා පැවැත්වූ බව සඳහන් මූලාශ්‍රය වන්නේ,

1) මහාවංශය
2) දීපවංශය
3) චූලවංශය
4) රසවාහිනිය

13) මහනුවර යුගයේ නර්තන කලාව සම්බන්ධ තොරතුරු වාර්තා කර ඇති දේශ සංචාරකයෙක් වන්නේ,

1) ඉබන් බතුතා
2) ජෝන් ඩේවි
3) ස්පිල්බර්ජන්
4) ෆාහියන් හිමි

14) මහා පරාක්‍රමබාහු රජතුමා විසින් නැටුම්, ගැයුම්, වැයුම් සඳහා ඉදිකරන ලද්දේ,

1) වටදාගෙන යි
2) නිශ්ශංකලතා මණ්ඩලයයි
3) සරස්වතී මණ්ඩපය යි
4) හැටදාගෙයයි

15) අනුරාධපුර යුගයේ නර්තන කලාව පිළිබඳ තොරතුරු අනාවරණය කර ගත හැකි ඓතිහාසික මූලාශ්‍රයක් වන්නේ,

1) උම්මග්ග ජාතකය යි.
2) චූලවංසය යි.
3) මහාවංසය යි.
4) සද්ධර්මාලංකාරය යි.

16) ලෝකමහාපායේ කැණීම්වලින් සොයාගත් වාදන රූකම් සහිත පේකඩ අයත් වන්නේ,

1) දඹදෙණි යුගයට ය.
2) පොළොන්නරු යුගයට ය.
3) මහනුවර යුගයට ය.
4) අනුරාධපුර යුගයට ය.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk

17) වංශකතා අතරින් පැරණිම මූලාශ්‍ර ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ,

1) මහාවංසය යි 2) චූලවංසය යි.

3) දීපවංසය යි. 4) දළ වංසය යි.

18) ''දේවාල විහාරවල තේවාව සඳහා නියයම වූ කුලවලින් පැමිණ කළගෙඩි සෙල්ලමේ යෙදෙන නළගනෝ වෙති'' යනුවෙමන් සඳහන් කරන්නේ කවුද?

1) ස්පිල්බර්ජන් 2) ෆාහියන් හිමි

3) ඉබන් බතුතා 4) රොබට් නොක්ස්

- **ප්‍රශ්න අංක 19 සිට 32 දක්වා නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

19) මහා පරාක්‍රමබාහු රජතුමාගේ හමුදාවේ ආස්වාදය පිණිස නළගන රැගුම් පවත්වා ඇති බව ........................................................................ සඳහන් වේ.

20) පණ්ඩුකාභය රජු ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවූ බව ..................................................... සඳහන් වේ.

21) චිත්තරාජ, කාලවේල, වලවාමුඛී වැනි යක්ෂ යක්ෂණීන් පුදන බවට තොරතුරු ඇත්තේ .................................................... රජුගේ කාලයේදී ය.

22) නුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නැටූ බවත් ඔවුන්ගේ උඩුකය නග්න වූ අතර යටිකය වැඩ දමූ වස්ත්‍රවලින් සරසා තිබූ බවත් සඳහන් කර ඇත්තේ කවුරුන් විසින්ද? ....................................................

23) අනුරාධපුර කුට්ටම් පොකුණෙහි කැණීම්වලදී හමුවූ ඓතිහාසික වටිනාකමකින් යුත් රූපය කුමක්ද? ....................................................

24) සැස්සේරුව සහ කොරවක්ගල ලෙන් ලිපිවල, නර්තනයේ යෙදෙන .................................................... සහ ඔහුගේ .................................................... ක් පිළිබඳ සඳහන් ය.

25) සරස්වතී මණ්ඩපය කරවන ලද්දේ .................................................... රජතුමා විසිනි.

26) රුවන්වැලි මහා සෑයේ ධාතු නිධානෝත්සව පෙරහැරෙහි නළගනන් 16,000 ක් සැරසුණු ආකාරය .................................................... ග්‍රන්ථයෙහි විස්තර කර ඇත.

27) සැටදාගෙයි රූකම් මූලාශ්‍ර කර ගනිමින් නර්තනය පිළිබඳව තොරතුරු අනාවරණය කරගත හැක්කේ කවර රාජ්‍ය යුගයකට අදාළව ද? ....................................................

28) නිශ්ශංකමල්ල රජතුමාට බලි යාගයක් කළ බවට .................................................... නමැති ග්‍රන්ථයෙන් තොරතුරු අනාවරණය කර ගත හැකිය.



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

Agaram.LK - Keep your dreams alive!

29) මහනුවර රජු යටතේ සිරකරුවෙකු ලෙස සිටි ඉංග්‍රීසි ජාතික ........................................................ ගේ දිනපොතෙහි නුවර පෙරහැරේ නර්තන ගැන සඳහනස් කර ඇත්තේ.

30) විමලධර්මසූරිය රජු කාලයේ දී ලංකාවට පැමිණි ලන්දේසි ජාතික දේශ සංචාරකයා කවුද?
........................................................

31) දැදිගම කොටවෙහෙරෙන් හමු වූ ඇත් පහනේ නළගන රූ ........................................................ යුගයේ නර්තන කලාව පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධකයකි.

32) පොළොන්නරු යුගයේ නර්තන කලාව පිළිබඳ සාකච්ඡා කිරීමේදී ........................................................ සහ ........................................................ රජවරුන්ගේ රාජ්‍ය යුගයන් වැදගත් වේ.

- **කෙටි පිළිතුරු සපයන්න.**

33) ශ්‍රී ලංකාවේ නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු අනාවරණය කර ගත හැකි මූලාශ්‍ර 03 ක් නම් කරන්න.

34) නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බවට මහාවංසය හා චූලවංසය ඇසුරින් සාධක 02 බැගින් ඉදිරිපත් කරන්න.

35) ලංකාවට පැමිණි විදේශ සංචාරකයන් තිදෙනෙක් නම් කර ශ්‍රී ලාංකේය නර්තනය පිළිබඳ ඔවුන් තබා ඇති වාර්තා පැහැදිලිව සඳහන් කරන්න.

36) එම වාර්තාවලින් එළඹිය හැකි නිගමන මොනවාද?

37) ශ්‍රී ලාංකේය නර්තන කලාවේ විකාසනය පිළිබඳ කරුණු අධ්‍යයනයේදී වැදගත්වන මූලාශ්‍ර පිළිබඳ වර්ගීකරණයක් කරන්න.

Agaram.LK - Keep your dreams alive!



agaram.lk